යම් යම් ජාතීන්, ජාතිකයන් හැඳින්වීම සඳහා කටවහරෙහි භාවිතා වන විවිධ නිෂේධනාත්මක යෙදුම් තිබේ. චීන ජාතිකයෙකු හැඳින්වීමට යොදන "චීනා" වැනි යෙදුමක් ඊට උදාහරණයකි. මේවා නිෂේධනාත්මක යැයි පැවසිය හැක්කේ, ඒ ඔස්සේ යම් කිසි අවමානාත්මක, කොන් කිරීමේ ස්වරයක් ජනිත වන බැවිනි. ඇතැම් විට මෙවැනි යෙදුම් දිගින් දිගටම භාවිතා කිරීම ඔස්සේ විදේශික භීතිකාවක් (xenophobia) පවා ජනිත නොවනු ඇතිදැයි අප ඇසිය යුතු වේ.

එසේම මෙම පුවත් අන්තර්ගතය තුළ "චීන ජාතිකයා" ලෙසින් වඩා නිවැරදිව සඳහන් වීම සලකා බලන විට, පුවත් වාර්තාවක් ලියනා මාධ්‍යවේදියා විසින් නොව අදාළ පුවත් කතුවරයා විසින් සිරස්තල යෙදීමට වැඩි ඉඩක් තිබීමද අවබෝධ කරගත යුතු වේ. සිරස්තලයට වැඩි ආකර්ෂණයක් ලබාදීම සඳහා හෝ සිරස්තලය තුළ අඩු වචන ප්‍රමාණයක් පවත්වා ගැනීමට "චීන ජාතිකයා" සිරස්තලය තුළ "චීනා" බවට පත් කර ඇතත්, එය කෙතරම් ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක් දැයි අප විමසිය යුතු වේ.

මෙවැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා වීම සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna